ස්විස් තානාපති කාර්යාලයේ සේවය කළ ගානියා බැරිස්ටර් හට චෝදනා පත්‍ර භාරදීම සම්බන්ධව අද දිනයේ (03/10) මාධ්‍ය තුළ සඳහන් වී තිබිණි. මෙහිදී අපට නිරීක්ෂණය කළ හැකි වූයේ, ලංකාදීප, අරුණ සහ අද පුවත්පත් මෙම ප්‍රවෘත්තිය ආචාර ධාර්මික අයුරින් ඉදිරිපත් කොට තිබූ බවයි.

කෙසේ නමුත්, මව්බිම පුවත්පත මෙහිදී "ගානියා බැරිස්ටර්ට අධිචෝදනා භාරදෙයි" යනුවෙන් මුල් පිටුවේ පළ වූ සිරස්තලයද සමගින්, ඇගේ ඡායාරූපයද රතු රවුමකින් සලකුණු කරමින් දක්වා තිබිණි. ඊට අමතරව, පුවත තුළ ඇය 'දමිළ කාන්තාවක්' බවද දක්වා තිබිණි.

මෙහිදී අපට මව්බිම වෙත ප්‍රශ්න කිහිපයක් යොමු කිරීමට හැක.

1) නීතිය ඉදිරියේ තවමත් සැකකාරියක පමණක් වන ගානියා බැරිස්ටර්ගේ ඡායාරූපය මව්බිම පමණක් පළ කර ඇත්තේත්, එය රතු රවුමකින් ඉස්මතු කොට ඇත්තේත් මන්ද? ඇයව පැහැරගෙන ලිංගික හිරිහැර සිදුකළ බවටද ඇය විසින් මූලිකව ඉදිරිපත් කළ චෝදනාවේ සඳහන් බවද මෙහිදී අවධාරණය කළ යුතු වේ. එහි සත්‍යාසත්‍ය භාවය තවම නීතියෙන් තීන්දු කොට නැත. එසේම මෙහිදී අනෙක් පුවත්පත් ඇගේ ඡායාරූපය පළ කර නොමැති බවද සැලකිල්ලට ගැනීමට සිදුවේ. එසේ බලන විට, ලිංගික හිරිහැරයක වින්දිතයෙකු විය හැකි අයෙකුගේ ඡායාරූපය මෙසේ පළ කිරීම කෙතරම් ආචාර ධර්මයන්ට අනුකූල වන්නේද?

2) පුවතකට සෘජුව අදාළ නොවන්නේ නම් යම් අයෙකුගේ වර්ගය හෝ ජාතිය සඳහන් නොකරන ලෙසට මාධ්‍ය ආචාර ධර්ම ඔස්සේ පැහැදිලිවම දැක්වී තිබියදීත්, මව්බිම පුවත්පත පමණක් ඇගේ ජාතිය 'දමිළ' ලෙසින් සඳහන් කිරීමේ අවශ්‍යතාවය කුමක්ද? එය පුවතට අදාළ වන්නේද?

එසේ ගත් විට, මේ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් නොවේද?

#MediaEthicsSL #Mawbima #Lankadeepa #Aruna #Ada